

# ජන කවියෙන් හෙළිවන ගැමියන් ගේ දාර්ශනිකත්වය හා සමාජ සංස්කෘතික පසුබිම

දියුණු අධ්‍යාපනික පසුතලයක් නොමැති වුවත්, තම ජීවන තක්සලාවෙන් ලැබුවා වූ පරිපාකයෙන් යුත් ගැමියන් අතින් නිර්මිත කවි ජනකවි ලෙස හඳුන්වයි. ගැමියා අත්දැකීම් සම්භාරයක් ලබා ගත්තේ තමා ජීවත් වු සමාජයෙනි. ඒ නිසා ඔවුන් ගේ අධ්‍යාපන තක්සලාව වූයේ සමාජයයි. ඔවුන් ගේ දාර්ශනික බව, ඔවුන් ගේ සමාජ සංස්කෘතික පසුබිම, සාරධර්ම සහ අගයන් පිළිබඳ ව තම අදහස් ජන කවියෙන් පිළිබිඹු වීම එහි ඇති විශේෂත්වයයි. දියුණු අධ්‍යාපනික හැදෑරීමක් නො ලද නමුදු ඔවුන් උපතින්ම රසිකත්වය උරුම කොට ගෙන පැමිණි පිරිසකි. ඔවුන් ගේ නිර්මාණ තුළ ඇති විශේෂත්වය නම් ඔවුන් සෑම දෙයකම යථාර්ථය දැකීමයි.

පහත සඳහන් කවිය ඊට එක් උදාහරණයකි.

වෙල් යායක ගොන් දෙන්නෙක් කකා    උනි
ඉන් එක් ගොනෙක් වලිගය නැතිව    වැනි
වලිගය ඇති ගොනා මැස්සන්ට බැට    දුනි
දුප්පත්කමත් වලිගය නැති ගොනා    වැනි

ගැමියා සමාජ යථාර්ථය ඇති සැටියෙන් දකී. ඔහු දකින ආකාරයට සමාජය කොටස් දෙකකින් යුක්ත වේ. එනම් ඇති නැති පරතරයයි. 'දුප්පත්කමත් වලිගය නැති ගොනා වැනි' යන කවි පාදය තුළින් එම අදහස මනා සේ පෙන්නුම් කිරීමට ගැමියා සමත් වෙයි. ගැමියා එදා දුටු සමාජ සත්‍යතාව වර්තමාන සමාජයට බොහෝ සේ සාධාරණ වේ. එසේ නම් ගැමියා මෙසේ ඥානාන්විත ව සිතීමටත්, තම ජීවන තක්සලාවේ උගැන්ම ඔවුන්ට බලපාන්නට ඇති බව මෙවන් බොහෝ නිර්මාණවලින් පැහැදිලි වේ. 'කාරිය කෙරෙන තුරු කාගෙත් රැවටිල්ල' වැනි වදන් සමාජයේ අද දක්වාම නොනැසී පවතින පිරුළු බවට ද පත් ව ඇත. පැලේ පැල් රකිමින් සිටින ගැමියකු තම හිතට නැගෙන අදහස් මෙසේ පවසයි.

කල් බලා නොවෙද ගොවිතැන්    කරන්නේ
මල්වරා නොවෙද කිරිවැද    පැසෙන්නේ
හෙනහුරා නොවෙද වැසි පල    නොදෙන්නේ
ලොව් තුරා බුදුන් කවදද    දකින්නේ

ගැමියන් අතින් නිර්මාණය වූ මේ කවිය කොතරම් අපූරු ද? මෙවන් ජනකවි තුළින් මනා සේ ඉස්මතු වන්නේ ඔවුන් ගේ අව්‍යාජකමයි. ගැමි සමාජයේ සංස්කෘතික පසුබිම මනා සේ විදහාපාන බොහෝ කවි ඔවුන් අතින් නිර්මාණය වී ඇත. සංස්කෘතික හරයන් වශයෙන් ගැමියන් ගේ ගති පැවතුම්, සිරිත් විරිත්, අදහස් උදහස්, ඇදහිලි හා විශ්වාස යනාදියෙන් ජන කවිය පෝෂණය වී ඇත. ගැමියා තමා කරන්නා වූ ඕනෑම කටයුත්තක දී මුල්තැන දී ඇත්තේ බුදුන් දෙවියන් අදහමින් තම කාර්යය මුදුන් පමුණුවා ගැනීමටයි. පහත දැක්වෙන්නේ ඒ අනුව නිර්මාණය වු ගොයම් කැපීමේ කවියකි.

| | |
|---|---|
| වරම් වරම් ඉරසඳ දෙවි අතින් | වරම් |
| වරම් වරම් මිහිකත් දෙවි අතින් | වරම් |
| වරම් වරම් සක්වල දෙවි අතින් | වරම් |
| වරම් ගොයම් කැපුමට දෙව්දුන්නේ | වරම් |

ගැමියා ඉර, සඳ, පොළොව යන ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් සලකා ඇත. ගොයම් කැපීම සඳහා මේ අයුරින් සෑම දෙවියන් ගේ ම අවසර පැතීමක් සිදුකර ඇත්තේ ඔවුන් සමාජයේ සංස්කෘතික පුරුෂාර්ථ අගය කිරීම හේතු කොට ගෙන ය. එසේම තමා ගේ කාර්යය අවසානයේ බුදුන්ට, දෙවියන්ට පින්දීමට ද අමතක නො කළේ ය.

| | |
|---|---|
| උදයට පායන ඉරු | දෙවියන්ටයි |
| සවසට පායන සඳු දෙවියන්ටයි | දෙවියන්ටයි |
| සතර සයුරේ වසනා දෙවියන්ටයි | දෙවියන්ටයි |
| සතර වරම් දෙවියෝ පින් ගන්ටයි | ගන්ටයි |

එකමුතු බව නිරන්තර අගය කළ ගැමියා ඒ බව පැවසුවේ,

| | |
|---|---|
| දුප්පත්කම කාට කාටත් ඇති | වීම |
| නැත විස්සා කවුරුත් කලියුග | දාම |
| එක්සත්කම සමඟ තිබුණොත් ගුණ | දාම |
| දුප්පත්කම මැකෙයි රිවි දුටු පිනි | සේම |

'එක්සත්කම සමඟ තිබුණොත් ගුණ දාම' මේ වදන කෙතරම් අර්ථවත් ද? වර්තමාන සමාජය තුළ නැත්තේ මෙවැනි ගුණාංග නොවේ ද?

එහෙත් එදා ගැමි සමාජයේ මේ උසස් ගුණාංග දුප්පත් මිනිසුන් ගේ පොහොසත් ආධ්‍යාත්මය පිළිබිඹු නො කරන්නේ ද?

සාරධර්ම පිරිපුන් හදවතක් උපතින් ම ගැමියන්ට උරුම වී තිබුණි. සාරධර්ම යනු සමාජයේ යහපත් පැවැත්ම සඳහා පිළිගැනෙන කාරණා ලෙස අර්ථ දැක්විය හැකි ය. පහත දැක්වෙන්නේ එසේ නිර්මාණය වු කවි කිහිපයකි.

'අම්මපල්ල බඹරුන් අත වරද නැති
බඹර කපන අය නරකාදියේ යති'
( බඹර ගී )

'උදයට පායන හිරු දෙවියන්ටයි
වැඳලා ගුරුවර අවසර ගන්ටයි'
( ගොයම් ගී )

'වැව බැඳි අපේ මුත්තට පිං දීපල්ලා'
( පැල්කවි)

'අපේ දුකට කැඩුවට බඹර බරු ගලේ
දෙවියනි වරද නැත නාඩං බඹර මලේ'
( බඹර ගී )

ගැමියා බඹර වද කැඩීම වරදක් ලෙස දකී. ඔහු තමා සිදු කරන වරදෙහි විපාකය ද දකී. එහෙත් තමා ගේ දරු පවුල රැක ගැනීමට මේ කාර්යය කරන නිසා දෙවියන් ගෙන් වරදට සමාව අයැද සිටියි. එසේම බඹරුන්ට මෙසේ ද පවසයි. 'බඹරෝ තොපට පිං අත්වෙයි කියන්නා' යනුවෙන් ගැමියා ගේ නිර්ව්‍යාජ, අවංක හැඟීම් විදහා දක්වමින් ඒ ඒ අවස්ථාවට උචිත අයුරින් නිර්මාණය වූ ජනකවි තුළින් ගැමියා ගේ දාර්ශනිකත්වය ගැමි සමාජයේ සංස්කෘතික පසුබිම සහ සාරධර්ම හා අගයන් පිළිබඳ තොරතුරු ගෙන හැර දැක්විය හැකි ය. ■

**ඩබ්. ඒ. දුමින්ද පද්මසිරි**

